උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 15

සසංකගෙ මරණය ආර්තීගෙ ජීවිතයට විශාල බලපෑමක් කළා. තමන්ගෙ එකම සහෝදරයා වෙනුවෙන් කිසිදු යුතුකමක් කරන්න බැරි වුණා ය යන හැඟීම තුළ ආර්තී විශාල වරදකාරී මානසිකත්වයකට ලක්වුණා කියල නිල්හාන්ටත් මටත් අවබෝධ වුණා. සසංකගෙ රෝගී තත්ත්වය , මංගලී විසින් ලෝකයාගෙන් සඟවා ගෙන සිටීම නිසා ආර්තීට තමන්ගෙ සහෝදරයගෙ අවසාන කාළෙ ගැන නිවැරදි තොරතුරක් ලබා ගන්න බැරවුණා. සසංකෙ සහ ආර්තී දුරකථනයෙන් අවශ්‍යතාවයකට විණා එකිනෙකා සමඟ කථා කළේ නැහැ. අපේ අම්මත් අප්පච්චිත් නිල්හාන් ට කරුණු අවබෝධ කරලා දීලා ආර්තිව කෙටිකළකට අපේ මහ ගෙදර තියාගත්තා. දරු දෙන්නගෙ පාසල් ගමන සහ අනික් කටයුතු ගැන මටත් නිල්හාන්ටත් බලාකියා ගන්න වුණා. අපි දරු දෙන්නත් එක්ක සෑම සති අන්තෙකම මාතලේ ගියා ආර්තී බලන්න. සති හයක් පමණ කාලයක් ආර්තී මාතලේ මහ ගෙදර හිටියා. ඔය අතරෙ අපේ පුංචි අම්මගෙ දානෙ යෙදුණ නිසා දරුදෙන්නත් මමත් නිල්හානුත් දින කිහිපයක් කල් ඇතුව ගමට ගියා.

ආර්තී බලවත් උනන්දුවක් දැක්වුවා දුලිනි ඉන්න තැනක් හොයා ගන්න. ඊට ප්‍රධාන හේතුව වුණේ සසංක දුලිනිට ලියපු මා සතුව තිබූ කවි පංතිය ඇය අතට පත් කිරීමේ අරමුණ. සසංක එවැන්නක් මගෙන් ඉල්ලපු නිසා දුලිනිව සොයා ගැනීමේ මගේ යටි හිත තුල තිබූ බලවත් කැමැත්තට සාධාරණ හේතුවක් පිටස්තර සමාජයෙන් මට සපයලා තිබුණා. දානෙට පෙර මාලිගාවට ගිහින් එන ගමනෙදි අහම්බෙන් මුණ ගැහුණු ආර්තීගෙ මිතුරියක් දුලිනි ගැන කිසියම් තොරතුරු කිහිපයක ඇයට ලබාදීලා තිබුණා.

ඒ වකවානුව වන විට සාරංග මගේ මිත්‍රයා මා වෙනුවෙන් ඕසට්‍රේලියානු සංචාරය සූදානම් කරමින් හිටියා. ජූලියානු එලඹෙන වසරේ මැද ලංකාවට එන තුරු අපේ හවුල් චිත්‍රපටියෙ වැඩ කටයුතු වලට එතරම් හදිසියක් නොතිබුණු නිසා මෙල්බර්න් සංචාරය ට එකතුවෙන්න ජූලියානා පවා මාව උනන්දු කළා.ඇය ඒ වෙද්දි හිටියෙ ග්‍රීසියෙ සංචාරයක් නිම කරමින්. එහිදි ඇය රැස් කරගත් බොහෝ දේ අපේ චිත්‍රපටියෙ තාක්ෂණික නිමාව වෙනුවෙන් යොදා ගන්න ඇය සැලසුම් කරමින් හිටියා.

ආර්තී මේ වෙද්දි යථා තත්ත්වයට පත්වෙමින් හිටි නිසා නිල්හාන්ට තදින්ම අවශ්‍ය වුණා නැවතත් ඇය කැටුව ගෙදර යන්න. තනුරක්කයි අපේ අම්මයි එක්ක බබෙක් වගේ හිටිය ආර්තීව ගෙදර යවන්න ඒ දෙන්න තරමක් පසුබෑවත් දරුදෙන්නගෙ වැඩ එක්ක නිල්හාන් තනිවම ඔට්ටුවෙන ගමන් රැකියාව කරන්න දරන වෙහෙස නිසා ආර්තී ගෙදර යන්න උත්සුක වුණා.මෙල්බර්න් ගමනට සූදානම් වෙන්න උවමනා කරන ලිපි සහ දේශන යනාදිය සකස් කරගන්න උවමනා නිසා මං මාතලේ නතර වුණා.

ඒ වෙද්දි අපේ අයියගෙ පුතා මනික් මෙල්බර්න් විශ්ව විද්‍යාලයට ශිෂ්‍යත්වයක් දිනාගෙන ගිහින් න්‍යෂ්ටික විද්‍යා ඉංජිනේරු උපාධියක් හදාරමින් හිටියා. මනික් තමන්ගෙ විශ්ව විද්‍යාලයෙම ඉගෙනගන්න ගැහැණු ළමයෙක් සමඟ ආදර සම්බන්ධයක් පවත්වන බව අපේ අයියයි තනුරක්කයි එක්ක සෑජුවම කියලා තිබුණා. ආර්තී ඔය ගැන දවසක් කියපු වෙලාවෙ නිල්හාන් උපහාසෙන් කිව්වා "අන්න කොල්ලො. ලව් කරනවා නං කෙලින් කියන්න ඕනෙ. අස්සයා ගියාට පස්සෙ ඉස්තාලෙ වහලා වැඩක් නැහැනෙ"

"උඹ මටද කියන්නෙ" කියලා මං ඇහුවම නිල්හාන් ගත් කටටම කිව්වෙ"පිස්සුද බං. උඹට නෙමේ , අපේ අල්ලපු ගෙදර අර බැඳල නැතුව වාත වෙවී ඉන්න මෙන්ඩිස් අංකල් ට මං කිව්වෙ. උඹට ඒක අදාල නැහැනෙ මචං. උඹ පපුව ඉස්සරහට දාලා ඕනෙ කෙල්ලෙක්ගෙන් යාළු වෙන්න අහන්න තරං මාර ගටක් තියෙන පට්ට පොරක් බව මං දන්නවනෙ මචං" කියලා

නිල්හාන් මගෙ පිටට තට්ටුවක් දැම්මෙ "පව් අප්පා" කියලා කියන ගමන්. මනික් ගෙ පෙම්වතිය රටේ නමගිය සිවිල් සේවකයෙක් දුවක් කියලා මීසක් එතැනින් එහාට දෙයක් මං දැනං හිටියෙ නැහැ. ඒත් මනික් මුලින්ම මනහාරිව මට අඳුන්නල දුන්න දවසෙ මගෙ උගුර හිර වෙලා ගියා. මට දැනුනෙ මං දුලිනිව දැක්ක වගේ. මං මොහොතක් හුස්ම නොගෙන ඒ ළමයගෙ මුහුණ දිහා බලං හිටියා.

"ඔයාගෙ තාත්තගෙ නම මොක්කද" මං ඒ ගැහැණු ළමයගෙන් ඇහුවෙ මගේ සැකය දුරු කරගන්න ඕනෙ නිසයි.

> ඔයා තමයා එයාව හොඳටම තේරුං අරන් එයා එක්ක ඉදිරි ජීවිතයක් ගෙවන්න පුළුවන් කෙනා



"නාත් වීරමන් කියන්නෙ අපෙ තාත්තා අංකල්"මනහාරි ඒ වචන ටික කිව්වම මට තේරුණෙ මගෙ සියොලඟම හිරිවැටුණාම වගේ. "එතකොට දුලිනි ඔයාගෙ පුංචිඅම්මද" මං ඇහුවා

"අංකල් අපේ පුංචිගෙ යාළුවෙක්ද"
එතනදි මගේ ජීවිතේ පුරාවට සුවඳක් වගේ හමන මගේ හිත ඇතුලෙ පිපිච්ච ආදරේ ගැන ඒ පොඩි කෙල්ලයි කොල්ලයි ඉදිරියෙ මං වක්කඩ කැඩුවා වගේ කියාගෙන ගියා. පුදුම ඉවසීමකින් හැමදේම අහන් හිටිය මනහාරි මගෙන් ඇහුවා ,

"එතකොට ඔයාටද ඒ අපේ පුංචි පන බයේ ඒ කාලෙ දුවලා තියෙන්නෙ. අනේ අංකල් ඕනෙ වෙලාවක ඇවිත් අපේ පුංචිට කථා කරන්න. එයාව බලාගන්න. ඔයා තමයා එයාව හොඳටම තේරුං අරන් එයා එක්ක ඉදිරි ජීවිතයක් ගෙවන්න පුළුවන් කෙනා"

ඒ ඉල්ලීම ඇතුලෙ මගේ සමස්ථ ජීවිතයම රැඳිලා තියෙන බව මට තේරුණා. ඒත් දුලිනි මොන වගේ විදියකට මාව බාරගනිද කියලා මට හිතාගන්න බැහැ. ජීවිතේ එයා මුහුණු දුන්න දේවල් එක්ක තවත් පුද්ගලයෙක් ගැන එයා ඉන්න තක්සේරුව කොහොම වෙයිද කියලා අනුමාන කරගන්න බැරුව මං අසරණ වුණා. ඒත් ආපහු ජීවිතේ වරද්ද ගන්න බැරි නිසා මේ පාර දුලිනිව අහිමි කරගන්න මං සූදානම් නැහැ.මං කොහොම හරි දුලිනිව මුණ ගැහෙන්න ඕනෙ කියන තීරණය බරපතල විදියට මගේ යටිහිතට දැනුම් දුන්නා.

මේ වෙද්දි සාරංග මං වෙනුවෙන් බොහෝ දේවල් සූදානම් කරමින් හිටියා. වෙහෙසකරම කටයුත්ත වුණේ මෙල්බර්න් නගරයේ ජීවත්වෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබෙන ආරාධනා අනුව භෝජන සංග්‍රහ වලට සහභාගී වෙන එක. ඇතැමෙක් මට ආරාධනා කළේ මා සමඟ හරවත් දෙයක් මගේ චිත්‍රපට ගැන කථාබහ කරන්නම නෙමේ. මාත් එක්ක ඡායාරූප අරන් මුහුණු පොතේ පලකරගන්න. ඉඳුවර බණ්ඩාරනායක සමඟ ඡායාරූපයක් අරන් මුහුණු පොතේ දාලා ලංකාවෙ ඉන්න නෑදෑයන්ට මිතුරන්ට පෙන්නලා ඔවුන් ලබන අහිංසක සතුට දැකලා මං සමහර අපහසුතා විඳදරා ගත්තා. කොහොමත් අපේ ලාංකීය සහෝදරවරු ප්‍රදර්ශන කාමය වඩන්න දක්ෂයි කියලා මෙල්බර්න් වල ප්‍රජා පුවත්පතක් කරන මගේ මිත්‍රයෙක් මට මතක් කරලා දුන්නා.


උපේක්ෂා සේනානායක
ලියයි


අතුල උපසිරි කල්දෙමුල්ල ගේ
සිතුවමින්

**මතු සම්බන්ධයි**